**ශීර්ෂය 001 - ජනාධිපති කාර්යාලය**
**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
----------------

**1.1 මතය**
**------**

ජනාධිපති කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනාධිපති කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මාර්තු 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජනාධිපති කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
**----------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.3 (අ) ඡේදයේ ඇතුලත් පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මත ඉදිරිපත් කරන ලද මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද විගණන නිරීක්ෂණයට අනුකූල වීමට කටයුතු කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිවද අදහස් දැක්වීම

### 1.6.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජනාධිපති කාර්යාලයේ සේවයේ නියුක්තව සිට විශ්‍රාම ගිය නිලධාරීන් තිදෙනෙකු ගෙන් අයවිය යුතු වර්ෂ 05 කට වඩා වැඩි, එකතුව රු. 341,094 ක් වූ ණය ශේෂ 2019 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වීම. |
| (ආ) | 2017 වර්ෂය තුළ සහ 2018 වර්ෂය තුළ වැඩ තහනම් කරන ලද නිලධාරීන් තිදෙනෙකුගෙන් 2021 අප්‍රේල් 27 දිනට අයවිය යුතු මුළු ණය ශේෂය රු. 363,017 ක් විය. | ණය ශේෂ ඇපකරුවන්ගෙන් අයකරමින් පවතී. | හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වීම. |
| (ඇ) | ජනාධිපති කාර්යාලයේ සේවයේ නියුක්තව සිට 2015, 2017, 2018 සහ 2019 වර්ෂ වලදී සේවය අතහැර ගොස් තිබු නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 974,813 ක ණය ශේෂ 2021 අප්‍රේල් 27 දිනට අය කර ගෙන නොතිබුණි. | ණය ශේෂ සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් විමසා ඉදිරි කටයුතු සිදුකිරීමට හා ඇපකරුවන්ගෙන් අයකරගැනීමට කටයුතු කරන බව දන්වමි. | හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වීම. |

**1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 454(1) ප්‍රකාරව 2019 වර්ෂයට අදාලව, ජනාධිපති මාධ්‍ය විශේෂ ඒකකය, නව මාධ්‍ය ඒකකය සහ වෙබ් අඩවි පරිපාලන අංශය යන අංශ 03 සඳහා බඩු ලේඛන පොත් පවත්වා නොතිබුණි. | 2020 වර්ෂයේ සිට මාධ්‍ය අංශය තුල වෙන් වෙන් වශයෙන් බඩු වට්ටෝරු පොත් පවත්වා ගැනීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතුවීම. |
| (ආ) | කොටුව ජනාධිපති මන්දිරයේ ගබඩාවේ හා පුස්තකාලයේ තැන්පත් කර තිබුණු විවිධ රටවලින් ජනාධිපතිවරයා වෙත ලැබී තිබුණු සිහිවටන හා ත්‍යාග ලේඛනගත කර නොතිබුණි. | 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් සිහිවටන හා ත්‍යාග සඳහා ලේඛනයක් සකස් කරනු ඇත. | විධිමත් ලේඛනයක් පවත්වා ගතයුතු වීම. |

**1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) අනුව්‍යවස්ථාව | 295, 266,140 | 2019 වර්ෂය අවසානය දක්වා ජනාධිපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක කෙරුණු නෙළුම් පොකුණ රඟහලේ ආදායම් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව, කටයුතු නොකොට ආරම්භයේ සිට මේ දක්වා එම ආදයම් පොදු තැන්පත් ගිණුමක රඳවා ගෙන ඒ මඟින් වියදම් දරමින් පැවතුණි. | නෙළුම් පොකුණ රඟහල සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් ප්‍රතිපාදන සලසාදීමක් සිදු නොකරන ලදී. එබැවින්, නෙළුම් පොකුණ රඟහලේ මුදල් පොදු තැන්පත් ගිණුමක රඳවාගෙන ඒ සඳහා වන වියදම් දරන ලදී. රඟහල සඳහා වන වියදම් දැරීමට මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන සලසා දීමක් සිදු කරන ලද්දේ නම් ඉන් ලැබූ ආදායම ආදායම් ශීර්ෂයක් වෙත බැර කිරීමට හැකියාව තිබුණි. | ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 අංක 20 දරන එකතුකල අගයමත සංශෝධිත බදු පනතේ 10(2) වගන්තිය | බදු අය කල හැකි ක්‍රියාකාරකමක් කර ගෙන යන සෑම තැනැත්තෙකුම ඔහුගේ බදු අය කල හැකි භාණ්ඩ හා සේවා සැපයුම කාර්තුවකට රු. මිලියන 3 ඉක්මවා ඇත්නම් හෝ වර්ෂයකට රු. මිලියන 12 ඉක්මවා ඇත්නම් එකතු කල අගය මත බද්ද (VAT) සඳහා ලියාපදිංචිය ලබාගත යුතු වුවද, කාර්යාලය යටතේ ක්‍රියාත්මක කෙරුණු නෙළුම් පොකුණ රඟහල ආරම්භ කර දැනට වසර 08 ක් ඉක්මවා තිබුණු අතර VAT බදු අයකර ගෙන තිබුණද, එසේ ලියාපදිංචිය ලබාගෙන එම මුදල් ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | නෙළුම් පොකුණ රඟහල වෙනම ආයතනයක් ලෙස ලියාපදිංචි වී නොමැති නිසා ඒ සඳහා එකතු කළ අගය මත වන බද්ද සඳහා ලියාපදිංචිය ලබාගැනීමද අවශ්‍යතාවයක් නොවීය. | පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකළ යුතු වීම. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

**2.1.1** **අධි ප්‍රතිපාදන සලසා ගැනීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 02 ක් සඳහා වර්ෂය තුළ සලසා තිබුණු රු.118,767,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම වර්ෂය අවසානයේදී ඉතිරි වී තිබුණි. | එක් විෂයක් මහා භාණ්ඩාගාරය විසින් 2019 මැයි මස සිට ‘‘ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් කැබිනට් නොවන අමාත්‍යාංශය’’ ලෙස නව වැය විෂයක් යටතේ ප්‍රතිපාදන සලසා දීම හා අනෙක් වැය විෂයේ යටතේ ක්‍රියාත්මක වීමට නියමිතව තිබූ ‘‘කුඩා ව්‍යාපාර හවුල්කාරීත්ව වැඩසටහන" සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා | මුදල් රෙගුලාසි 50 පරිදි කටයුතු කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | ජාත්‍යන්තර අරමුදලින් (IFAD) ලබා දිය යුතුව තිබූ මුදල සඳහා එම අරමුදලින් අනුමැතිය නොලැබීම නිසා ඉතිරි වී ඇත. | |
| (ආ) | වැය විෂයයන් 33 ක් වෙනුවෙන් අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම වැය විෂයයන්ගේ ප්‍රතිපාදන උපයෝජනය කල පසු ඉතිරිය, සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 45 ක සිට සියයට 94 ක් දක්වා පරාසයක පැවතුණි. | අයවැය ඇස්තමේන්තුවලින් අනිවාර්ය ඉතිරිකිරීම්, අක්මුදල් ප්‍රමාණවත් පරිදි නොලැබීම, 2153/12 හා 2019.12.10 දිනැති ගැසට් නිවේදනය අනුව සංවර්ධන වැඩසටහන් වෙනත් ආයතන යටතේ ගැසට් කිරීම හා භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය පරිදි ආරම්භ නොකළ ව්‍යාපෘති නතර කිරීම මීට හේතු වී ඇත. | මුදල් රෙගුලාසි 50 පරිදි කටයුතු කලයුතු වීම. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ඇ) ඡේදය ප්‍රකාරව බැරකම් එම වර්ෂයේදීම නිරවුල් කල යුතු බැවින් බැරකම් ඉදිරි වර්ෂයට ගෙන යා නොහැකි වුවද, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක **(iii)** හි සඳහන් පරිදි, කාර්යාලය විසින් රු. 1,093,497,793 ක බැරකම් වලට එළඹ තිබුණි. | කාර්යාලය යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති යටතේ නිදහස් කරන ලද ප්‍රතිපාදන මත මෙම බැඳීම් ඇතිකරගෙන තිබේ. 2019.12.31 දිනට අක්මුදල් නොලැබීම නිසා මෙම බැරකම් මූල්‍ය ප්‍රකාශනවල අංක iii යටතේ ඇතුළත් කිරීමට සිදුවිය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළයුතු වීම. |
| (ආ) | මු.රෙ. 94.1 ප්‍රකාරව ප්‍රතිපාදන රහිතව බැරකම්වලට එළඹිය නොහැකි වුවද, විෂයය 04 ක් යටතේ සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය වූ එකතුව රු.216,854 ක ප්‍රතිපාදනය රු.21,075,243 කින් ඉක්මවා රු.21,292,097 ක බැරකම්වලට එළඹ තිබුණි. | මු.රෙ. 94/2 යටතේ අර්ථකථනය කළ වියදම් සේ සලකා බැරකම් වලට එළඹ ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළයුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 11 කට වැඩි කාලයක් ජනාධිපති කාර්යාලය මඟින් ක්‍රියාත්මක කෙරුණු විශේෂ ව්‍යාපෘති 05 ක ප්‍රතිපාදන ඉතිරිවීම් සියයට 26 සිට සියයට 55 දක්වා පරාසයක විය. | අංක 12/2153 හා 2019.12.10 දිනැති ගැසට් නිවේදනය මගින් විශේෂ ව්‍යාපෘති වෙනත් අමාත්‍යාංශ යටතේ පැවරීම සිදු කර ඇත. | අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළයුතු වීම. |
| (ආ) | ජනාධිපති කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂවලදී ඉහත කී එක් එක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදුන් ප්‍රතිපාදන හා ඒවායේ ප්‍රගතිය පිළිබඳව නියැදි පදනම මත තෝරාගත් නුවරඑළිය දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| | (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘති යෝජනා 07 න් 4 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය වෙතින් රු.21,950,910 ක ප්‍රතිපාදන වර්ෂය තුළ ලබා දී තිබූ අතර, ඉන් එක් ව්‍යාපෘතියක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. ඉතිරි ව්‍යාපෘති සඳහා ලද ප්‍රතිපාදන මුදල් ව්‍යාපෘති කටයුතු ආරම්භ නොකිරීම හේතුවෙන් 2019 නොවැම්බර් 20 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/GPS/155/09/01/HA-2019 ලිපියට අනුව රු.7,124,713 ක එම ප්‍රතිපාදන ආපසු හරවා යවා තිබුණි. | අනුමත කර ඇති ව්‍යාපෘති 04 සඳහා ප්‍රතිලාභීන් තේරීම හා පුහුණු කිරීම සඳහා සැලකියයුතු කාලයක් ගත වී ඇති අතර, භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/GPS/155/09/01/HA-2019 හා 2019.11.20 දිනැති ලිපියට අනුව ආරම්භ නොකළ ව්‍යාපෘති නතර කිරීමට සිදුවිය. | අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළයුතු වීම. |
| | (ii) නයි මිරිස් වගාවට අදාලව රජයේ සහ සියයට 50 ක ප්‍රතිලාභී දායකත්වය යටතේ ව්‍යාපෘතිය කොත්මලේ සහ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ක්‍රියාත්මක කිරීමට රු.2,927,775 ක ප්‍රතිපාදන මුදල් ජනාධිපති ලේකම් කාර්යාලය වෙතින් 2019 සැප්තැම්බර් 25 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණි. 2019 ජනවාරි මස සිදු කළ යුතුව තිබූ ප්‍රතිලාභීන් නිශ්චිතව හඳුනා ගැනීම 2019 ඔක්තෝබර් 28 දින දක්වා ප්‍රමාදවී තිබුණි.අනතුරුව ඔවුන්ගේ සියයට 50 දායකත්වය ලබාගෙන ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ නොකිරීමත්, පොලි ටනල් ඉදිකිරීම | නයිමිරිස් වගාව සඳහා පොලි ටනල් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් තේරීම හා පුහුණු කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගත වී ඇති අතර, භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/GPS/155/09/01/HA-2019 හා 2019.11.20 දිනැති ලිපියට අනුව ආරම්භ නොකළ ව්‍යාපෘති නතර කර ඇත. | අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළයුතු වීම. |

සඳහා ප්‍රසම්පාදන කටයුතු නොකිරීමත් හේතුවෙන් මෙම ප්‍රතිපාදන හරවා යවා ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි.

(ඇ) දිස්ත්‍රික්කය වෙත ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය සඳහා ලබාදී තිබුණු ප්‍රතිපාදන මත 2018 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති 15 න් 06 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අත්හැර දමා තිබුණි.ක්‍රියාත්මක තත්ත්වයේ පැවති කර්මාන්තවලද ඉලක්ක හා භෞතික තත්ත්ව පහත පරිදි විය.

| | | |
|---|---|---|
| (i) කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පූඩළුඔය දකුණ ග්‍රාම නිලධාරී වසම තුළ ජීවත්වන ඇඳුම් මැසීමේ කර්මාන්තයේ නියුතු ප්‍රතිලාභීන් 35 දෙනෙකු සඳහා රු.1,559,687 ක වියදමක් දරා මහන මැෂින් ලබාදී තිබුණි. ග්‍රාම ශක්ති විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රතිලාභීන් ලබා ගන්නා ආදායමෙන් කිසියම් දායකත්වයක් අදාළ සමිති සංවර්ධනය සඳහා අනෙකුත් ව්‍යාපෘති වලින් ලබාදී තිබුණද මෙම ව්‍යාපෘතිය මඟින් ලබන ආදායමෙන් සමිතියේ සංවර්ධනය සඳහා ප්‍රතිලාභීන්ගේ දායකත්වයක් ලබාගැනීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා ප්‍රතිලාභීන්ගේ දායකත්වය සඳහා වූ වාරික අය කිරීම ප්‍රමාණවත් නොවන ආකාරයෙන් සිදුවන බව වාර්තා වී ඇත. කොත්මලේ ප්‍රාදේශීය ලේකම් මේ සඳහා පියවර ගන්නා බව වාර්තා කර ඇති බැවින්, සමිතියේ සංවර්ධනය සඳහා ඉදිරියේදී යොදා ගැනීමට හැකි බව ද දැනුම් දී ඇත. | අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළයුතු වීම. |
| (ii) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පොරමඩුල්ල ග්‍රාම නිලධාරී වසමෙහි හණ නිෂ්පාදනය ප්‍රවර්ධනය මඟින් වසමේ ජීවත්වන ප්‍රජාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම අරමුණු කරගත් ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.2,589,602 ක වියදමක් දරා තිබුණි.2019 මාර්තු 12 දින රු.120,000 ක් වැය කර හණ නිෂ්පාදන යන්ත්‍රය මිලදී ගෙන තිබුණද, හණ පැළ සිටුවා තිබුණේ 2019 ඔක්තෝබර් මාසයේදීය. දැනට අවට ප්‍රදේශවල ඇති හණ කෙඳි නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගන්නා අතර කර්මාන්තයේ නිරත පුද්ගලයන් බොහෝ දෙනෙක් යන්ත්‍රය මඟින් හණ කෙඳි නිෂ්පාදනය කර ගැනීමේදී අතිරේක මුදලක් ගෙවීමට සිදුවන බැවින්, සම්ප්‍රදායික ක්‍රමයට කෙඳි නිෂ්පාදනය සිදුකර තිබුණෙන් 2019 මාර්තු සිට දෙසැම්බර් දක්වා යන්ත්‍රය මඟින් රු.2,505කආදායමක් පමණක් උපයාගෙන තිබුණි. | හණ ව්‍යාපෘතිය හඳුන්වාදීමේදී සම්ප්‍රදායානුකූල ක්‍රමවේදයෙන් ඉවත් වී ව්‍යාපෘති සඳහා හඳුන්වාදුන් යන්ත්‍රය යොදා ගැනීමේ යම් පසුබෑමක් සිදුවුවද මේ වන විට රැකියා අවස්ථා 45ක් ජනිත වී ඇති බවද වාර්තා කර ඇත. | අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළයුතු වීම. |

(ඇ) 2030 වර්ෂය වනවිට ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ දරිද්‍රතාවය සම්පූර්ණයෙන් තුරන් කිරීමේ තිරසර සංවර්ධන අරමුණ පෙරදැරිව ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය යටතේ තෝරාගත් ග්‍රාම නිලධාරී වසම් තුළ ග්‍රාමශක්ති ජනතා සමිති ස්ථාපිත කර තිබුණි.නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 හි පළමු අදියර යටතේ 2018 වර්ෂය තුළ සමිති 15 ක් සහ එහි දෙවන අදියර යටතේ 2019 වර්ෂය තුළ සමිති 45 ක් ස්ථාපිත කර තිබුණි.

| | | | |
|---|---|---|---|
| (i) | ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයේ අරමුණු, ප්‍රතිපත්ති, පරමාදර්ශ හා මූලධර්ම සැලකීමේදී වසමෙහි බහුතර පිරිසකට ප්‍රතිලාභ අත්වන පරිදි ක්‍රියාත්මක වීම සඳහා වසමේ මුළු ජනගහනයෙන් බහුතරයක් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ සාමාජිකත්වය දැරිය යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 හි වසම්වල සමස්ත ජනගහණයට සාපේක්ෂව සමිති සාමාජිකත්වය සියයට 0.75 ත් සියයට 43 ත් අතර පවතින සමිති සංඛ්‍යාව 49 ක් වූයෙන් ග්‍රාමීය ජනතාව වැඩසටහන කෙරෙහි දක්වන අනුකූලතාවය පහළ මට්ටමක පැවතුණි. | ග්‍රාමශක්ති ව්‍යාපාරයේ අරමුණ වූයේ වසමේ බහුතර පිරිසකට ප්‍රතිලාභ ලැබෙන ලෙස කටයුතු කිරීම වුව ද ප්‍රායෝගිකව ග්‍රාමීය ජනතාව වැඩසටහන කෙරෙහි දක්වන අනුකූලතාව පහළ මට්ටමක පවතින බව වාර්තා කර ඇත. | අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළයුතු වීම. |
| (ii) | 2018 වර්ෂයේ එක් සමිතියකට රු.500,000 බැගින් සමිති 07 ක් සඳහා ලබාදුන් එකතුව රු.3,500,000 ක ප්‍රතිපාදනයෙන් විගණිත දිනය වූ 2020 ජනවාරි 16 වන විටත් කිසිදු මුදලක් ජීවනෝපාය සංවර්ධන කටයුතු සඳහා උපයෝජනය කර නොතිබුණි. | ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අවශ්‍යතාවය මත සහන පොලී අනුපාතයන් යටතේ ණය ලබා දීමට මෙම මුදල් වෙන් කර ඇතත් මෙතෙක් කිසිවකු ණය ඉල්ලුම්කර නොමැත. මෙම මුදල් සමිති විසින් රාජ්‍ය බැංකුවක තැන්පත් කර ඇත. | අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළයුතු වීම. |
| (iii) | හැකියා වර්ධන අරමුදල (ධාරිතා සංවර්ධනය) සඳහා රු.300,000 ක මුදලක් සමිතියකට වෙන්කර ඇති අතර ග්‍රාම ශක්ති සමිති 2 ක් සඳහා ලබාදී තිබූ එකතුව රු.600,000 ක් වූ ප්‍රතිපාදනයෙන් කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණි. සමිති 07 ක ප්‍රතිපාදන උපයෝජනය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 1 සිට සියයට 22 අතර පරාසයක පැවතීමෙන් ප්‍රතිපාදන උපයෝජනය දුර්වල මට්ටමක පැවතුණි. | ධාරිතා සංවර්ධනය සඳහා වෙන් කර ඇති මුදල් ද ඒ ඒ සමිතියේ කාලීන අවශ්‍යතාවය මතු වූ පසු උපයෝජනය කරනු ලබන බව දැනුම් දී ඇත. | අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළයුතු වීම. |
| (iv) | "ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයේ ගමන් මග" අත්පොතෙහි දෙවන පරිච්ඡේදය අනුව ප්‍රජාව වෙනුවෙන් ග්‍රාමශක්ති ජනතා සමිතියේ විධායක සභාවට ඉටුකරලීමට ඇති වගකීම් | ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයේ සමිති ව්‍යවස්ථාව අතිශය සංකීර්ණ වන අතර, සියළුම කව පිහිටුවා ඒවා සක්‍රිය | අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සම්භාරය අතිමහත් වන හෙයින් ග්‍රාමීය සංවර්ධනය එකී කාර්යයන් කාර්යක්ෂමව සහ අප්‍රමාදව ඉටුකරලීමට සමිතියේ විධායක සභාවේ සභායට ස්ථිර කමිටු 07 ක් පිහිටුවා ගතයුතු බව දක්වා තිබුණි. පළමු අදියරේ සමිති 15 අතුරින් සමිති 14 ක් තරුණ කවයද, සමිති 10 ක් හැකියා වර්ධන හා සන්නිවේදන කමිටුවද පිහිටුවා නොතිබුණි.දෙවන අදියර යටතේ ලියාපදිංචි කරන ලද සමිති 41 ක් අතුරින් සමිති 08 ක හැකියා වර්ධන හා සන්නිවේදන කමිටුවද, සමිති 05 ක තරුණ කවයද පිහිටුවා නොතිබුණි. | තත්ත්වයේ පවත්වාගෙන යාමේ ප්‍රායෝගික ගැටළු පවතින බවත්, කෙසේ වුවද නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය සැලකිය යුතු මට්ටමකින් සාර්ථකව ක්‍රියාවට නැංවීමට හැකි වූ බවත් සඳහන් කර ඇත. | |
| (v) | ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය හා කාන්තා සහභාගීත්වය වැඩි සංවිධාන රටාවේ මුල්ම පුරුක ලෙස සාමාජිකයන් 5 – 6 ත් අතර පිරිසකගෙන් යුක්ත කුඩා කණ්ඩායම් පිහිටුවා දුප්පත් ජනතාව ශක්තිමත් කර නායකත්වයට යොමු කිරීමේ වැදගත්ම අවස්ථාවකි. පළමු අදියරේ සමිති 14 ක් අතුරින් සමිති 05 ක් පර්ෂද පිහිටුවා නොතිබූ අතර, දෙවන අදියරේ සමිති 41 ක් අතුරින් සමිති 22 ක් කුඩා කණ්ඩායම් සහ සමිති 30 ක් පර්ෂද පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයට අදාල වසම් භාර ආර්ථික සංවර්ධන නිලධාරින් සියළුදෙනා ගෙන්වා මෙම කුඩා කණ්ඩායම් සහ පර්ෂද පිහිටු වීම හා මේවන විටත් ක්‍රියාකාරි තත්ත්වයේ නොමැති විශේෂයෙන්ම ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීම සඳහා සෘජු දායකත්වයක් නොමැති එවැනි කුඩා කණ්ඩායම් හා පර්ෂද පිළිබඳ සොයා බලා ඒවා ක්‍රියාකාරි තත්ත්වයට පත් කිරීමට කටයුතු කරන බවත් සඳහන් කර ඇත. | අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළයුතු වීම. |

**3.2 වත්කම් කළමනාකරණය**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| **(i)** | කොළඹ කොටුව ජනාධිපති මන්දිරයට අදාලව පවත්වා ගෙන ගොස් තිබූ භාණ්ඩ බඩු වට්ටෝරු පොත්වල ඇතුලත් භාණ්ඩ අයිතම 45 කට අදාල ඒකක 129 ක භෞතික පැවැත්ම විගණනයට ඉදිරිපත් කළ 2019 වර්ෂයේ සිදුකල භාණ්ඩ සමීක්ෂණය මඟින් තහවුරු කරගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් විගණනය විසින් සිදු කළ භෞතික පරීක්ෂාවේදී අනාවරණය වු පරිදි, මෙම භාණ්ඩ පරිශ්‍රයේ භෞතිකව ඇති බව | කොටුව ජනාධිපති මන්දිරයේ භෞතිකව පවතින බව අනාවරණය නොවූ භාණ්ඩ සම්බන්ධයෙන් සිදු කරනු ලබන විමර්ශනයෙන් පසු අනාවරණය වන කරුණු සඳහා මුදල් රෙගුලාසි අනුව ඉදිරි කටයුතු කරනු ඇත. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අනාවරණය නොවූ අතර මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එසේම,භාණ්ඩ වට්ටෝරු පොත්වල ඇතුළත් වී නොතිබූ එකතුව අයිතම 15 ක ඒකක 32 ක්,බඩු වට්ටෝරු පොත් අංකයක් සහ බඩු වට්ටෝරු පොතට අනුව ශේෂයක් සහිතව 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් කර තිබුණි. | | |
| **(ii)** | මන්දිරයේ උද්‍යාන පාලකභාරයේ තිබූ භාණ්ඩ බංගලා භාරකරුගේ බඩු වට්ටෝරු පොත්වලට ඇතුළත් වී නොතිබුණි. මේ සම්බන්ධයෙන් 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවෙන්ද පෙන්වා දී ඇති නමුත් විගණිත දිනය වන විටත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බංගලා භාරකරුගේ භාණ්ඩ වට්ටෝරු පොත සියළු භාණ්ඩ ඇතුලත් වන පරිදි 2020 භාණ්ඩ සමීක්ෂණයේදී නිවැරදි කරනු ඇත. 2020 වසරේ සිදු කරනු ලබන වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී, සමීක්ෂණ මණ්ඩල නිලධාරියකු යටතේ නිවැරදි කිරීම සිදු කිරීමට කටයුතු කරනු ඇත. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |
| **(iii)** | මන්දිර භාරකරු විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව, කොටුව ජනාධිපති මන්දිරයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 12 ක ඒකක 24 ක් මහගමසේකර මාවත, ජනාධිපති නිල නිවසේ අවශ්‍යතාවයන් සඳහා නිකුත්කර තිබුණි. මෙම භාණ්ඩ මහගමසේකර මාවත, ජනාධිපති නිල නිවසට නිකුත් කිරීමේදී නිකුත් කිරීමේ නියෝග මඟින් අදාල බඩු වට්ටෝරු පොත්වලට ඇතුළත් කළ යුතු වුවද ඒ අනුව ක්‍රියා කළ බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවූ අතර කොටුව මන්දිරයේ බඩු වට්ටෝරු පොත්වල මේ සම්බන්ධයෙන් ගැලපීමක් හෝ සිදුකර නොතිබුණි. | පහත සඳහන් භාණ්ඩ හිටපු ජනාධිපති නිල නිවසට බාර දී ඇති බව ලිඛිතව තහවුරු කර ඇත.<br>Treadmill - 01<br>Weight Scale (electric) - 01<br>AC(18000BTU/43000BTU)-01<br>ACPanasonic (15000BTU/43000BTU) -01<br><br>අනෙකුත් භාණ්ඩ ලැබී ඇති බව තහවුරු කර ගැනීම සඳහා හිටපු ජනාධිපතිතුමාගේ පෞද්ගලික ලේකම් වෙත දන්වා අදාල තහවුරු කිරීම් ලබා ගැනීමට කටයුතු කර ඇත. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(iv)** | ජනාධිපති ලේකම් කාර්යාලයේ ලේඛන වලට අනුව ජනාධිපති මන්දිරය නමින් නිකුත් කල භාණ්ඩ, භාරගත් නිලධාරීන් විසින් මන්දිරයේ ඉන්වෙන්ට්‍රියට ඇතුලත් කිරීමකින් තොරව විවිධ ස්ථානවලට රැගෙන ගොස් තිබුණු අවස්ථා විගණනනයේදී නිරීක්ෂණය විය. | ගබඩාවෙන් භාණ්ඩ භාරගත් නිලධාරීන් එම භාණ්ඩ අදාල ස්ථානය වෙත භාර දීම සම්බන්ධයෙන් වූ අඩුපාඩු පිළිබඳ මූලික විමර්ශනයක් සිදු කර අනාවරණය වන කරුණු අනුව ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |
| **(v)** | 2018 වර්ෂයේ සිදුකල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් කර තිබූ යෝජනා ක්‍රියාත්මක කර ඊට අදාල ගැලපීම් බඩු වට්ටෝරු පොත්වලට ඇතුලත් කර නොතිබුණි. | 2018 භාණ්ඩ සමීක්ෂණයෙන් පසු කොටුව ජනාධිපති මන්දිරයේ භාණ්ඩ සම්බන්ධයෙන් විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරන ලද පරීක්ෂණයට අමතරව ජාතික විගණන කාර්යලය විසින්ද පරීක්ෂණ සිදු කරන ලදී. ඒ අනුව විගණනයෙන් පෙන්වා දී ඇති භාණ්ඩ වට්ටෝරු පොත්වල අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |
| **(vi)** | භාණ්ඩ නිකුත් කිරීමේ නියෝග පත්‍ර පරිගණකගත පද්ධතියෙන් බැහැරව නිකුත් කර තිබූ අතර එහිදී එම නිකුත් කිරීමේ නියෝග පත්‍රවල අදාල භාණ්ඩ වර්ගය හා නියෝග පත්‍රයේ අනුක්‍රමික අංකය අතින් ලියා හෝ අනුක්‍රමික අංකයක් නොමැතිව නිකුත්කර තිබූ  අවස්ථා නිරීක්ෂණය විය. | හදිසි හා අත්‍යවශ්‍ය අවස්ථාවන්හිදී තාවකාලික නිකුත් කිරීම් නියෝග ලබා දීමට සිදු වුවද, පසුව ඒ සඳහා විධිමත් නිකුත් කිරීමේ නියෝග ලබා දීම සිදු කරනු ලැබේ. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |
| **(vii)** | බොහෝ අවස්ථා වලදී, ජනාධිපති ලේකම් කාර්යාලයේ ගබඩාවෙන් ජනාධිපති මන්දිරය සඳහා නිකුත් කල භාණ්ඩ වලට අදාල භාණ්ඩ නිකුත් කිරීමේ නියෝග බලයලත් නිලධාරී (ප්‍රධාන ගණකාධිකාරී) විසින් අනුමත කර නොතිබූ අතර නිකුත් කිරීමේ නිලධාරීගේ අත්සන පමණක් යොදා තිබුණි. | භාණ්ඩ නිකුත් නියෝගයට පෙර භාණ්ඩ ඉල්ලුම්කරන පත්‍රිකාව බලයලත් නිලධාරියකු විසින් අනුමත කිරීම සිදු කරනු ලැබේ. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |
| **(viii)** | ජනාධිපති කාර්යලයෙන් පිටතට භාණ්ඩ නිකුත් කිරීමේදී ගේට්ටු අවසර පත්‍ර භාවිතා කලයුතු වුවද එසේ නොමැතිව කොටුව ජනාධිපති මන්දිරය වෙත භාණ්ඩ නිකුත් කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. | ඇතැම් අවස්ථාවලදී මිල දී ගනු ලබන භාණ්ඩ ජනාධිපති කාර්යාල පරිශ්‍රය තුලට ගෙන ඒමෙන් තොරව සෘජුවම ජනාධිපති කාර්යාල පරිශ්‍රයෙන් පිටත භාණ්ඩ අවශ්‍ය ස්ථානය වෙත බාරදීම සිදු කරන බැවින්, එවැනි අවස්ථාන්හිදී ගේට්ටු අවසරපත් උපයෝගී කොට නොගනී. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ix)** | භාණ්ඩ භාරගත් බවට අදාල නිලධාරියාගේ නම, අත්සන හා දිනය ලබාගෙන නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කිරීමේදී බාරගන්නා නිලධාරියාගේ නම, තනතුර හා හැඳුනුම්පත් අංකය හෝ සේවා අංකය ලබා ගැනීමට මේවන විට කටයුතු කර ඇත. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |
| **(x)** | භෞතික පරීක්ෂාවේදී හඳුනාගත් ජනාධිපති මන්දිරය තුළ වූ භාණ්ඩ අයිතම 05 ක ඒකක 59 ක් බඩු වට්ටෝරු පොත්වල ඇතුළත් කර නොතිබුණි. | අදාල භාණ්ඩ භෞතිකව පවතින බැවින් 2020 භාණ්ඩ සමීක්ෂණයේදී වට්ටෝරු පොත්වලට ඇතුලත් කිරිමට කටයුතු කරනු ඇත. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |
| **(xi)** | මු.රෙ 753 (2) ට අනුව පොදු 219 ලැබීම් නියෝගය මගින් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වට්ටෝරු පොතට ඇතුළත් කර ගබඩාවට ඉදිරිපත් කළයුතු වුවද, වර්ෂ 2017 සිට 2020 දක්වා එසේ කටයුතු කර නොමැති අවස්ථා නිරීක්ෂණය විය. | පෙර වර්ෂවල ලැබීම් නියෝග නිකුත් නොකිරීම සමබන්ධයෙන් ඒ පිළිබඳ වගකිවයුතු පාර්ශව කැඳවා මූලික විමර්ශනයක් සිදු කිරීමට කටයුතු සූදානම් කර ඇත. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |
| **(xii)** | කොටුව ජනාධිපති මන්දිරයේ වර්තමාන මන්දිර භාරකරු 2020 මාර්තු 20 දින එවකට සිටි මන්දිර භාරකරුගෙන් භාණ්ඩ භාර ගැනීමේදී භාණ්ඩ අයිතම 123 ක ඒකක 224 ක් අඩුවෙන් භාරගෙන තිබුණි. එම භාණ්ඩ ඌනතාවය සම්බන්ධයෙන් විධිමත් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | භාණ්ඩ බාරදීමේදී සිදු වී ඇති අඩුපාඩු නිරීක්ෂණය කර ඇති බැවින්, මූලික විමර්ෂණයක් සිදු කර අනාවරණය වන කරුණු අනුව ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |
| **(xiii)** | වර්තමාන මන්දිර භාරකරු විසින් එවකට සිටි මන්දිර භාරකරුගෙන් භාණ්ඩ භාර ගැනීමේදී බඩු වට්ටෝරු පොත්වල සඳහන් ශේෂයන් සමඟ භෞතිකව පරීක්ෂා කරමින් එදිනට පවතින තථ්‍ය ශේෂය ලබාගත යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | මෙම කාරණය නිවැරදි කිරීම සඳහා භාණ්ඩ භාරදීම/ භාරගැනීම පිළිබඳ විධිමත් උපදෙස් ඇතුලත් අභ්‍යන්තර චක්‍රලේඛයක් මේ සඳහා නිකුත් කර ඇත. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |
| **(xiv)** | එවකට සිටි මන්දිර භාරකරු විසින් 2019 නොවැම්බර් 18 දින ජනාධිපති මන්දිරයේ භාණ්ඩ භාර ගැනීමේදී, (ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (අභ්‍යන්තර පාලන) ගේ දුරකථනයෙන් දැනුම් දීමට අනුව) නව ගොඩනැගිල්ලේ ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩ වර්ග 35 ක ඒකක 61 ඌණතාවයන් තිබෙන බවට අනාවරණය කරගෙන තිබුණද , ඊට අදාල ඉදිරි පියවර ගෙන නොතිබුණි. | ඌණ භාණ්ඩ සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් සම්බන්ධයෙන් මූලික විමර්ෂණයක් සිදු කර අනාවරණය වන කරුණු අනුව ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(xv)** | කාර්යාලය යටතේ ක්‍රියාත්මක වූ ජාතික ආර්ථික සභා කාර්යාලය, එහි ඇති කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ සමඟ තරුණ කටයුතු අමාත්‍යාංශයට එවකට සිට පරිපාලන නිලධාරියෙකු ඇතුළු කණ්ඩායමක් විසින් අදාල පාර්ශව වෙත භාරදී තිබුණි. මූලික ගිවිසුමට ඇතුළත් වන අවස්ථාවේදී ජනාධිපති කාර්යාලය විසින් සමාගම වෙත ගෙවූ රු. 16,868,576 ක් වූ තැන්පතු මුදල, මේ වන විට ගිවිසුම් කාලය අවසන් වී ඇති බැවින් නැවත ජනාධිපති ලේකම් කාර්යාලය වෙත අයකරගෙන නොතිබුණි. | “ජාතික ආර්ථික සභාවේ”කාර්යාල පරිශ්‍රය හා එහි කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ 2019.12.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය වෙත පවරා දී ඇති බවට ලිඛිත සාක්ෂිද ගොනු කොට ඇත.<br><br>ශ්‍රී ලංකා ජාතික ආර්ථික සභාව පිහිටුවීම පිණිස ජනාධිපති කාර්යාලය Overseas Reality (Ceylon) Plc සමග මූලික ගිවිසුමට ඇතුළත් වන අවස්ථාවේදී ජනාධිපති කාර්යාලය විසින් සමාගම වෙත ගෙවූ තැන්පතු මුදල, මේ වන විට ගිවිසුම් කාලය අවසන් වී ඇති බැවින් නැවත භාණ්ඩාගාරය වෙත ගෙවීමට කටයුතු කරන ලෙස ක්‍රීඩා හා තරුණ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත දන්වා ඇත. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |
| **(xvi)** | විශේෂ මාධ්‍ය ඒකකය ඇතුළු මාධ්‍ය අංශයේ භාණ්ඩ බොහොමයක් එවකට මාධ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරීන් විසින් හිටපු ජනාධිපතිතුමාගේ නිල නිවස වෙත භාරදුන් බව දක්වා තිබුණද, විධිමත් භාණ්ඩ සමීක්ෂණයක් හරහා එම භාණ්ඩවල පැවැත්ම තහවුරු කරගෙන නොතිබුණි. | 2020 භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව ජනාධිපති මාධ්‍ය අංශයේ භාණ්ඩ හඳුනාගැනීම සඳහා පත් කර ඇති විශේෂ කමිටු වාර්තාවෙන් අනාවරණය කර ගන්නා කරුණු අනුව හිටපු ජනාධිපතිතුමාගේ පෞද්ගලික ලේකම් වෙතින් තහවුරු කිරීම් ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |
| **(xvii)** | ජනාධිපති ලේකම් නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී තිබුණු නමුත් භෞතික පැවැත්ම/සන්තකය තහවුරු නොවූ වාහන 50 ක් පිළිබඳව පරීක්ෂාකර බලා නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි. එසේම, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව ජනාධිපති ලේකම් කාර්යාලය, ජනාධිපති මන්දිර හා ජනාධිපති ආරක්ෂක අංශවල ලිපිනයන් යටතේ, වෙනත් පුද්ගලයින්ගේ නමින් ලියාපදිංචි වූ | 2016 වර්ෂයේ සිදු කරන ලද වාහන සමීක්ෂණය මගින් වාහන 14 ක් භෞතිකව පවතින ස්ථාන සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනීමට හැකි වී ඇති අතර, මේ වන විට එම වාහනවල ලියාපදිංචි අයිතිය පවරා දීමට කටයුතු කරමින් පවතී. එසේ තෙරෙතුරු සොයා ගැනීමට නොහැකි වූ වාහන 38 ක් පිළිබඳ නිවැරදි තොරතුරු ශ්‍රී ලංකා පොලීසිය | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වාහන 53 ක් වූ අතර එම වාහන ජනාධිපති ලේකම් කාර්යාලය හා ඒ ආශ්‍රිත අංශවල ලිපින යටතේ ලියාපදිංචි වීමට හෝ එම ලිපින භාවිතා කිරීමට හේතු විගණනයට අනාවරණය නොවුණි. | වෙතින් ලබා ගැනීමට ලිපි යොමු කර ඇත. | |
| **(xviii)** | ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහන 69 ක් 2016 වර්ෂයේදී යුධ හමුදාවට භාරදී තිබුණු අතර එම වාහන අතරින් වාහන 06 ක් තවදුරටත් ජනාධිපති ලේකම් නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති බව අනාවරණය විය. එසේම,ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් ජනාධිපති ලේකම් නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිකර තිබුණු වාහන 47 ක් විවිධ පුද්ගලයින් හා ආයතන වලට නිකුත් කර තිබුණු නමුත්, මේ දක්වා එම වාහන නැවත පවරා ගැනීමට හෝ ඊට අදාල විධිමත් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ජනාධිපති ලේකම් කාර්යාලය විසින් යුද්ධ හමුදාවට ලබා දී තිබූ වාහන අතරින් මෙතෙක් පවරාගෙන නොමැති වාහන 06 පවරා ගැනීමට කටයුතු කරන ලෙස යුද්ධ හමුදාවට දැනුම් දී ඇත. වෙනත් ආයතන වෙත ලබා දී ඇති වාහන අතරින් වාහන 27 ක් පිළිබඳ තොරතුරු මේ වන විට ලබා ගෙන අදාල පැවරීම් කටයුතු සිදු කරමින් පවතී. අනෙකුත් වාහන 20 පිළිබඳ නිවැරදි තොරතුරු ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. එසේ ලබා ගන්නා තොරතුරු අනුව අදාල පැවරීම් සිදු කරනු ඇත. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. |
| **(xix)** | භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව කෙරීගෙන යන වැඩ යටතේ ජනාධිපති කාර්යාලයට අදාලව රු. 80,437,366.66 දක්වා තිබුණද, ජනාධිපති කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවල එය ගොඩනැගිලි හා ඉදිකිරීම් යටතේ දක්වා තිබුණි. | භාණ්ඩාගාර වාර්තා අනුව කෙරීගෙන යන වැඩ යටතේ ජනාධිපති කාර්යාලයට අදාලව රු.80,437,366.66 ක් ගොඩනැගිලි හා ඉදිකිරීම් යටතේ දක්වා ඇත්තේ එහි සඳහන් වත්කම් වර්ගීකරණ අංකය (61114) විසර්ජන ගිණුමේ ආකෘති තුළ ඇතුළත් නොවූ බැවිනි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ පරිදි මූල්‍ය ප්‍රකාශන භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව පිලියෙල කළ යුතුය. |

**3.3 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | මාධ්‍ය අංශය ප්‍රධාන ඒකක 04 ක් යටතේ ක්‍රියාත්මක වී තිබුණු අතර 2019 නොවැම්බර් මාසයේදී නව කාර්ය මණ්ඩලය මාධ්‍ය අංශය භාරගැනීමේදී "නව මාධ්‍ය අංශයේ " හැර වෙනත් කිසිදු අංශයක භාණ්ඩ විධිමත් පරිදි භාරගැනීමක් සිදුකර නොතිබුණි. ඒ අනුව නව කාර්ය මණ්ඩලය භාණ්ඩ භාරගන්නා අවස්ථාවේදී පැවති තත්‍ය ශේෂයන් පිළිබඳ පිළිගත හැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. කෙසේ වුවද, අංක PMD/ENG/INV/20/01 හා 2020 ජනවාරි 06 දිනැතිව ජනාධිපති මාධ්‍ය අංශයේ ඉංජිනේරුවන් විසින් ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් කර තිබූ " මාධ්‍ය අංශය සතුව තිබී අස්ථාන ගතවූ උපකරණවල දළ වටිනාකම" මැයෙන් වූ වාර්තාව අනුව එම වටිනාකම රු. 34,189,688 ක් පමණ වූ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව මෙතෙක් කටයුතු කර නොතිබුණි. | 2020 භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව ජනාධිපති මාධ්‍ය අංශය තුල දැනට පවතින භාණ්ඩ හා ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සමස්ථ ඇගයීමක් සිදු කරමින් පවතී. ඒ සඳහා දැනට පවතින භාණ්ඩ හා ඒවායේ ක්‍රියාකාරීත්වය හා පවතින ස්ථානය පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් සකස් කිරීම විශේෂ කමිටුවකට පවරා ඇත. ඒ අනුව අනාවරණය කර ගන්නා කරුණු මත වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළයුතු වීම. |
| **(ii)** | එම අස්ථානගත වත්කම් තුල ඇතුලත් 2015 වර්ෂයේ සිට 2020 ජනවාරි මාසය දක්වා මාධ්‍ය අංශය වෙත රු. 17,786,325 ක් වටිනාකමැති ලැප්ටොප් පරිගණක 104 ක් ලබාදී තිබුණු අතර ඉන් විගණිත දිනය වන විට LAPTOP පරිගණක 26 හා Mac Book Air වර්ගයේ පරිගණක 2 ක් පමණක් ද නැවත කාර්යාලය වෙත භාරදී තිබුණි. | 2020 භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව ජනාධිපති මාධ්‍ය අංශය තුල දැනට පවතින භාණ්ඩ හා ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සමස්ථ ඇගයීමක් සිදු කරමින් පවතී. ඒ සඳහා පත් කර ඇති කමිටු වාර්තාව අනුව ඌණ හා අක්‍රිය භාණ්ඩ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | එසේම ,ඒ තුළ 2015 වර්ෂයේ සිට 2020 ජනවාරි මාසය දක්වා ලබා දි තිබූ රු. 10,380,423 ක් වටිනාකමැති DESKTOP පරිගණක 52 කින් පරිගණක 4 ක් නැවත භාරදී තිබුණු අතර පරිගණක 2 ක් නැවත භාවිතයට ගත නොහැකි මට්ටමට පත්ව තිබුණි. එසේම විගණනය විසින් සිදුකල භෞතික පරික්ෂාවේදී බොහෝ desktop පරිගණක භාවිතයට ගත නොහැකි මට්ටමේ තිබූ බව නිරීක්ෂණය විය. | 2020 භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව ජනාධිපති මාධ්‍ය අංශය තුල දැනට පවතින භාණ්ඩ හා ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සමස්ථ ඇගයීමක් සිදු කරමින් පවතී. ඒ සඳහා පත් කර ඇති කමිටු වාර්තාව අනුව ඌණ හා අක්‍රිය භාණ්ඩ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළයුතු වීම. |
| **(iv)** | එම අස්ථානගත වත්කම් තුළ 2015 වර්ෂයේ සිට 2020 ජනවාරි මාසය දක්වා මාධ්‍ය අංශයට අනුයුක්තව සිටි නිලධාරීන් වෙත නිකුත් කර තිබූ රු. 3,470,742 ක් වටිනාකමැති ජංගම දුරකතන හා I PAD 45 ක් වූ අතර ඉන් ජංගම දුරකථන 14 හා I PAD 03 ක් ආපසු කාර්යාලය වෙත භාරදී ඇති බව දන්වා තිබුණද, ඉන් ජංගම දුරකථන 09 ක් ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණු අතර භාරදී තිබුණු I PAD 02 ක් අක්‍රියව පැවතුණි. | 2020 භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව ජනාධිපති මාධ්‍ය අංශය තුල දැනට පවතින භාණ්ඩ හා ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සමස්ථ ඇගයීමක් සිදු කරමින් පවතී. ඒ සඳහා පත් කර ඇති කමිටු වාර්තාව අනුව ඌණ හා අක්‍රිය භාණ්ඩ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළයුතු වීම. |

**3.4 අනාර්ථික ගනුදෙනු**

**-------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **---------------------** | **----------------------------** | **-----------** |
| 2017 අගෝස්තු 15 වන දින අංක 17/1591/701/025 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත "ශ්‍රී ලංකා ජාතික ආර්ථික සභාව" පිහිටුවා තිබුණු අතර අමාත්‍ය මණ්ඩල සටහනට අනුව එහි කාර්යයන් 06 ක් විය. සභාව පිහිටුවීමෙන් පසු එහි අරමුණු / ඉලක්ක ළඟා කර ගැනීම සම්බන්ධව සකස් කළ සැළසුම් හා එම සැළසුම් ළඟා කර ගැනීමේ ප්‍රගතිය සම්බන්ධ තොරතුරු විගණනය විසින් ඉල්ලා සිටියද, එම තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොවිය. කෙසේ වුවද, සභාවේ මහලේකම්වරයා 2019 අගෝස්තු 01 දින සිට විදේශ නිවාඩු ලබාගෙන ඇමරිකාව බලා | ශ්‍රී ලංකා ආර්ථික සභාව පිහිටුවීමේ අරමුණු / ඉලක්ක ලඟා කරගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් වූ ලිපිගොනු විගණන අවශ්‍යතාවයන් සඳහා ලබා දීමට හැකිය. | අපේක්ෂිත අරමුණු/ ඉලක්ක ළඟාකර ගත හැකිවන පරිදි රජයේ මුදල් කළමනාකරණය කළ යුතු වීම. |

පිටත්ව ගොස් ඇති බවත් එම නිවාඩුව අවස්ථා දෙකකදී 2019 ඔක්තෝබර් 18 දක්වා දීර්ඝ කරන ලෙස ඉල්ලා ඇති බවත්, ඒ අනුව මාස 3 කට ආසන්න කාලයක් විදේශ නිවාඩු ලබා ඇති බැවින් සභාවෙන් ඵලදායි සේවාවක් සිදුවන බව නිරීක්ෂණය නොවන බවත් දක්වා තිබුණි. ඒ අනුව, ආර්ථික සභාවේ කාලය අවසන් කිරීමටත්, තනතුරු අහෝසි කිරීමටත් 2019 ඔක්තෝබර් 09 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, මෙම ආර්ථික සභාව සඳහා 2017 අගෝස්තු මස සිට 2019 දෙසැම්බර් මාසය දක්වා මාස 29 ක කාලය තුල රු. 237,784,472 ක වියදම් දරා තිබුණි.

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණිත දිනය වන විට, ජනාධිපති කාර්යාලය විසින් භාවිතා කරමින් තිබූ ගබඩා කළමනාකරණ මෘදුකාංග පද්ධතිය, 2013 වර්ෂයේදී පෞද්ගලික ආයතනයකින් රු.මිලියන 1.6 ක මුදලකට මිලදී ගෙන තිබූ අතර ගබඩා අංශය විසින් එම පද්ධතිය වැඩිදියුණු කිරීමේ යෝජනා 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වරින් වර ඉල්ලීම් ඉදිරිපත් වී තිබුණද, ඒ පිළිබඳව ඉදිරි කටයුතු සිදු කර නොතිබුණි. | ජනාධිපති කාර්යාලයේ ගබඩා කළමනාකරණ පද්ධතිය මේ වන විටත් නිසි ක්‍රියාකාරී මට්ටමේ පවතී. පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා හඳුනාගත් ඇතැම් කාර්යයන් සඳහා යෝජනා පමණක් වරින් වර ඉදිරිපත් කර ඇති අතර, එම කටයුතු සිදු කරනු ඇත. | පද්ධතිය යාවත්කාලීන කළයුතු වීම. |